## තවමත් නොනැසුණු අතීත උරුමයක්

# නිල්ලග්ගම බෝධි ඝරය

සටහන සහ ඡායාරූප
ජනක වෙත්තසිංහ



නිල්ලග්ගම බෝධි ඝරයේ ඉදිරිපස දසුන

විචිත්‍ර කැටයම් අතින් නිල්ලග්ගම බෝධිඝරය අභිබවන සුළු වෙනත් සමකාලීන අන් කිසි ගොඩනැගිල්ලක් නොමැති බව මහාචාර්ය සෙනරත් පරණවිතාන පවසයි.

අටවැනි හෝ නවවැනි සියවසට අයත් මෙම බෝධිඝරය පුරාවිද්‍යාව, වාස්තු විද්‍යාව සහ කලාත්මක අතින් අද්විතීය නිමැවුමකි.

වන වදුලට යටව සුන්බුන් ගොඩක් බවට පත්ව තිබූ මෙම සුවිශේෂී නටබුන් ප්‍රථමයෙන් සොයා ගනු ලැබුවේ 1895 වසරේ දී පුරාවිද්‍යාව පිළිබඳව කීර්ති නාමය හිමිකර ගෙන සිටි එච්. සී. පී. බෙල් මහතා විසිනි.

ඉතික්බිති වසර හැටක් පමණ දීර්ඝ කාලයක නිද්‍රාගත සමයකින් පසු මෙම බෝධිඝර නටබුන්වලට පුනර්ජීවයක් ප්‍රදානය කළේ මහාචාර්ය සෙනරත් පරණවිතානයන් විසිනි. ඒ 1954 වසරේ දී ය. මෙම බෝධිඝරය පැරණි බෝධිඝරයක පැහැදිලි ස්වරූපය මොනවට විදහා දක්වන නිසා වත්මන් පරපුරට මනා අධ්‍යයනයකට ඇවැසි සාධකයන් සපයයි.

එවන් වකවානුවක මෙවන් අංග සම්පූර්ණ වූ බෝධිඝරයක් මෙතෙක් ලංකාවේ කිසිදු ස්ථානයකින් තවමත් සොයා ගෙන ස්ථාපනය කිරීමට නොහැකි වී ඇති නිසා නිල්ලග්ගම බෝධිඝරයේ තවදුරටත් අද්විතීය ස්ථානයක පවතී.

මෙම බෝධිඝරය සම්පූර්ණයෙන් ම ගොඩනගා ඇත්තේ කළු ගලෙනි. එය අපගේ මීමුත්තන්ගේ විස්මිත ගල්වඩු දැනට කීකරුව විචිත්‍ර වූ කැටයමින් ඔපවත් වූ ඉපැරණි උරුමයේ උදාර ලකුණ නිහඬ බසින් හඬ ගා කියනු වැනිය.



මැද මළුව

මළු දෙකකින් සමන්විත නිල්ලග්ගම බෝධිඝරයේ පවුරු නිමකර ඇත්තේ සම සතරැස් ආකාරයට මූණතට කළු ගල් ලැලි ඇල්ලීමෙනි. නැගෙනහිරින් සහ බටහිරින් මුහුණට මුහුණ ලා සැදි පිවිසුම් දොරටු දෙකකි. එහි ශෛලමය උළුවහු විචිත්‍ර කැටයමින් හැඩවැඩ කර ඇත. පිටත මළුවේ පැත්තක දිග අඩි 43 ක් පමණ වේ. මැද මළුව පිහිටියේ පහළ මළුවට සමව මැදිනි. එහි පාදමේ පළල අඩි 13 කි. පොළොවේ සිට උස අඩි 6 යි අගල් 6 කි. එදවස බෝධීන් වහන්සේ රෝපණය කර ඇත්තේ එම මැද මළුව මතය. අත්තිවාරම උඩ පිහිටි කැටයම් ගල් වැට අනුක්‍රමයෙන් පහළ සිට ඉහළට උඩ අතට විහිදුණු නෙළුම් මල් පියලි රටාවෙන් කැටයම් කර ඇත. එයින් උඩ කොටස ඇතුන්ගේ ඉදිරිපස පමණක් දක්වෙන කැටයමින් ඔපවත් කර තිබේ. ඇත් ලීස්තරය මත පටි කැටයමින් යුත් ගල් පෙළක් ද, එය මත දික් අතට සිට වූ ගල් ලැලි පෙළක් ද, ඒ ගල් ලැලි මත උඩු අතට හා යටි අතට කැටයම් කළ පියුම් පෙළක් ද දිස් වෙයි. මළුවට ඇතුල් වන ශෛලමය උළුවස්ස අඩි 7 යි අගල් 5 උසය. පළල අඩි 5 කි. එය ද විචිත්‍රවත් ලෙස කැටයම් කර ඇත.



පිවිසුම් දෙරටුවක්

ඇතුල් මළුවේ අත්තිවාරමේ පඩි ලැල්ලේ පිට පැත්තේ හංස රූප පෙළකි. උඩු පත්තේ ලියවැල් පෙළකි. පවුර මැද ගල් ලැලි සිංහ රූප පෙළකින් කැටයම් කර ඇත. එහි ඉදිරිය බලා සිටිනා ඇනතියා හිඳගෙන සිටින සිංහ රුවින් ද, පසුපස බලමින් දෙපසට ගමන් කරන විලාශයේ සිංහ රුවින් ද විචිත්‍රවත්ව ඇත.

පහත මළුවේ බිම ගල් ලැලි අතුරා තිබේ. එම මළුවේ කෙළින් සිටුවන ලද ගල් කණු කීපයක් දිස් වෙයි. පැරණි දවස ඒ මත දැවයෙන් ඉදි කළ පියසක් තිබුණු බවට සාධක හමු වී තිබේ. බෝ වෘක්ෂය වන්දනා මාන කිරීමට එන බැතිමතුන්ට අව්වෙන් වැස්සෙන් වන පීඩාවන්ට පිළියමක් ලෙස මෙසේ පියස්සක් එදා සවි කරන්නට ඇත.

බටහිර දෙරටුවට වම් පසින් වූ අත්තිවාරම් ගලෙහි අටවැනි හෝ නවවැනි හෝ සියවස්වලට අයත් සිංහල අක්ෂරයෙන් "මොනර ගල් බුද්මි මෙ දස ඇතුන් කරවා මහ බෝයි පිදු පිනෙන් අනුත්තර සම්මා සම්බු ..." යනුවෙන් සටහන්ව ඇති බව සෙනරත් පරණවිතාන පවසයි. එම වදනේ අවසන් කොටස මැකී ගොස්ය. ඉහත පාඨයෙන් අදහස් වන්නේ, "මම මොනරගල බුත් වෙමි. මේ දස ඇතුන් කරවා මහා බෝධියට පූජා කළ පිනෙන් සම්මා සම්බුද්ධත්වය ලැබේවා" යනුවෙනුයි.

මෙහි දස ඇතුන් යනු පවුරේ ඉදිරිපස කැටයම් කරන ලද ඇත් රූ දහය විය හැකි බව පරණවිතානයන්ගේ අදහසයි.

මෙම ස්ථානය මෙතරම් ආකර්ශනීය ලෙස ගොඩ නගා ඇත්තේ මෙය අති පූජනීය සිද්ධස්ථානයකට කැපකර තිබූ නිකේතනයක් විය හැකි නිසා බව පරණවිතානගේ මතය වේ.

ඇතැම් විටක මෙම බෝධිඝරයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ මුල් අංකුරයක් රෝපණය කළ ස්ථානයක් විය හැකි බව ද ඔහු අදහස් කරයි.

මධ්‍යකාලීන බෝධිඝරයන්ට සම්බන්ධ සෙසු ගොඩනැගිලි කාලයත් සමග මිනිසුන්ගේ අතින් නොයෙකුත් විපත්වලට ගොදුරුව විනාශ වී මැකී ගොස් තිබෙනවා විය හැක. එසේ නොවුනහොත් ඒවා සමහර විටෙක අනාගත ගවේශකයකුගේ උදැල්ලෙන් මතු කරනා තුරු පස යට වැළලී තිබෙනවා විය හැක. නිල්ලග්ගම බෝධිඝරය ගැන සටහන් තැබීමේ දී සෙනරත් පරණවිතානයන් සටහන අවසන් කරන්නේ එසේ පවසමිනි.

අපගේ අතීත උරුමයන් වැළලී යන යුගයක නිල්ලග්ගම බෝධිඝරයවන් පුරා වස්තුන් හඬ නගා කියන පණිවිඩය පමණක් අපි අසා සිටිමු. වැලලී යන අපේ උරුමය මිහිමතට රැගෙන විත් වඩා හිඳුවීමට සුදුසුම කාලය එළඹ ඇත්තේ දැන් යැයි සිතේ. එහෙත් තවත් බෙල් වැන්නකු හෝ සෙනරත් පරණවිතාන කෙනකු හෝ බිහි නොවීමේ අඩුව පිරිමැසිය නොහැකි පාඩුවකි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව නගරයෙන් මොරගොල්ලාගම පාරේ විත් ගල්ලැව හන්දියෙන් ඇති අළුපතගම පාරේ සැතපුම් 3 ක් පමණ යන විට නිටලව විද්‍යාලය හමු වේ. මීටර් 100 - 200 ඉදිරියට ගොස් හෙට්ටිගම හන්දියෙන් - නිල්ලග්ගම බෝධිඝර පාරේ ආ විට මෙම ස්ථානයට ළඟා විය හැක.

**ඇසුරු කළේ -**
**සෙනරත් පරණවිතානයන්ගේ**
**පුරාවිදු පරියේසණ නම් ග්‍රන්ථයයි.**